# ආදි බුදුසමයේ පෞරුෂය සැකසීමෙහිලා බලපාන මානසික සහ භෞතික සාධක පිළිබඳ අධ්‍යයනයක්


වටිනාපහ දේවානන්ද හිමි

FGS/P/2001/488/R


සාමාජීය විද්‍යාපති (දෑවුරුදු) දර්ශනය උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස

කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන

පර්යේෂණ නිබන්ධයකි.


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1177 |
| වර්ග අංකය: | |



අප්‍රේල් 2015

## සාරාංශය

මිහිමඬල විශ්වයට අයත් ය. පුද්ගලයා මිහිමඬලට අයත් ය. විශ්වයට සාපේක්ෂ ව සලකා බැලීමේ දී, මිහිමඬල යනු ඉතා කුඩා ඒකකයක් වුව, විශ්වයේ පවත්නා මූලික ලක්ෂණ සියල්ල ම මිහිමඬලට ද, මිහිමඬලේ වසන සියලු සත්ත්වයන්ට ද අදාළ වන බව මෙහි දී කිව යුතුය. නමුදු එවන් පුළුල් පරාසයක් ආවරණය කිරීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා නොකෙරේ. මෙහිදී සාකච්ඡා කෙරෙන්නේ සුවිශේෂී වශයෙන් පුද්ගලයා සහ පුද්ගල පැවැත්ම පිළිබඳවය. පෞරුෂ ස්වභාවය සැකසෙන ආකාරය පිළිබඳව ය.

මෙම අධ්‍යයනය සිදුකරනු ලබන්නේ මූලික බුදුසමය ඇසුරිනි. "පෞරුෂය" යනුවෙන් ව්‍යවහාරයක් බුදු සමයෙන් හමුනොවෙයි. පෞරුෂය යන්න නූතන මනෝවිද්‍යා ක්ෂේත්‍රයෙහි එන්නකි. මනෝවිද්‍යාව තුළ පුද්ගල පෞරුෂය පිළිබඳ විමසුමක් ගෙන එන්නේ ඥානමය අර්ථයකින් වුව බුදුසමයෙහි පුද්ගල පැවැත්මෙහි ස්වභාවය ප්‍රඥාමය ඇසකින් හඳුනාගැනෙයි.

විශ්වමය භෞතික ශක්ති සංයෝජනය වීමෙන් ද්‍රව්‍ය සැකසෙයි. භෞතික ශක්ති හා විඥානය සංයෝජනය වීමෙන් පුද්ගල පැවැත්ම සැකසෙයි. විඥානමය ශක්තියේ ප්‍රතිඵලයක් වශයෙන් අසීමිත චින්තන හැකියාව පාදකව, අභිමත ලෙස හසුරුවා ගත හැකි ස්වයං චලන නිසා සත්ත්ව තලයේ උපරිම ස්ථානයක මානවයා පසුවෙයි.

සත්ත්ව සංහතියේ යහපැවැත්ම අගයන බුදු දහම මානව චින්තනයේ අග්‍රඵලයක් වශයෙන් හඳුනාගත හැකියි. විඥානමය හා භෞතිකමය අංශද්වයෙහි සමවායෙන් යුක්ත ප්‍රවාහය එනම්, ගලායෑම පුද්ගල පැවැත්ම ලෙස හඳුනාගනු ලබයි. විඥානමය ප්‍රවාහය වේදනා, සංඥා, සංඛාර පද්ධති හේතුකොට එනම්, පාදක කොට ගලායයි. එම ගලායන විඥානමය ප්‍රවාහය ම නැවත නැවත වේදනා, සංඥා, සංඛාර පද්ධති ගොඩනගයි.

ප්‍රතීත්‍යසමුත්පන්න ව ගලායන මෙම ප්‍රවාහය "මම" යන සම්මුති අර්ථයකින් හඳුනාැනෙයි. සංසාර පාර්ශ්වීය සිතුවිලි හා බැඳී, ස්වයං පාලන හැකියාව දුර්වල ව අහිතකර චර්යා ජනිත කරවයි. එම අහිතකර චර්යා පාදකකොට නැවත නැවත සංසාර පාර්ශ්වීය ව බලගැන්වෙයි. මෙම ක්‍රියාවලියෙහි සංකීර්ණ ස්වභාවය මත පුද්ගල විවිධත්වය බිහිවෙයි. පෞරුෂමය වශයෙන් කෙනෙක් අනෙකාගෙන් වෙනස් වෙයි.

තමා පිළිබඳ වගකීම, තම අනන්‍යතාවය ගොඩනැංවීම තමා සතු වූවක් ම බව එනම්, තමාට අයත් වූවක් ම බව මූලික බුදුසමය පෙන්වා දෙයි. භෞතික මානසික අන්‍යෝන්‍ය සබඳතාවයෙන් ගලාගෙන ප්‍රවාහයට කායික වාචසික මානසික වශයෙන් ප්‍රබුද්ධ චර්යා මුසුකොට ගලායෑමෙහි හැඩය වෙනස් කිරීමෙන් පෞරුෂය තමන්ට අවශ්‍ය අයුරින් සකසාලිය හැකියි. එනම්, සංසාර පාර්ශ්වීය බලපෑම් එල්ලවන සීමාවෙන් ඔබ්බට ජීවිතය ගෙන යා හැකියි.

බුදුසමයෙන් ඉගැන්වෙන්නේ මෙය ම බවත්, ඒ සඳහා වන මාහැඟි ආකෘතිවලින් බුදුසමය අනූන බවත්, මෙහිදී කිවයුතුයි. බුදුරදුනට සිදුකළ හැක්කේ එබඳු ආකෘති ඉදිරිපත් කිරීම පමණක් බවත්, එම ආකෘති තුළ තම තමන්ගේ ජීවිත ස්ථාපිතකොට ප්‍රබුද්ධ ජීවන ශෛලියක් සහිත පෞරුෂමය ගොඩනැංවීමක් සඳහා වන ස්වකීය අභිමතය, අවසාන වශයෙන් වැදගත් වන බවත් මෙහිදී පැහැදිලි කර ගත යුතුයි.

මුඛ්‍ය පද - පෞරුෂය, ආදි බුදුසමය, කය සහ මනස, ව්‍යූහය, ප්‍රබුද්ධ ක්‍රියාවලිය

## Abstract

Earth belongs to the universe. Person belongs to the earth. It must be stated here that, although the earth is a small unit when compared with the universe, all the basic characteristics of the universe relate to the earth and to all beings living on the earth. But this study does not expect to cover such a wide range. This study is specially about the person, the existence of person and about how the personality traits are framed.

This study is done in relation to Buddhism and that too relating to original Buddhism. We do not come across any reference to personality in Buddhism. Such reference is found only in the study of modern psychology. In modern psychology inquiry in to personality is in relation to knowledge. But in eastern philosophy the nature of the existence of person is recognized in relation to wisdom.

Matter takes shape by the combination of physical energy of the universe. The existence of the person is caused by the combination of that physical energy and consciousness. By self movements that could be controlled at will through the unlimited power to think as a result of the power of consciousness, the human being takes the highest position in the plane of living beings.

Buddhism which values the wellbeing of all beings could be recognized as the highest result of human thought. The flow of unity of the two compositions, consciousness and physical form called name and form is recognized as personal existence. The flow of consciousness is caused by the aggregate of feeling, perception and mental formation. This very flow of consciousness in return causes aggregate of feeling, perception and mental formation.

This flow of aggregates through cause and effect is recognized with the help of concept. With the help of concept 'I' it develops its identity. Cyclic thoughts weaken the power of self control of person and develop unwholesome behavior. That unwholesome behavior again and again encourages the cycle of existence. The diversity of person is caused by the complex nature of this process. One person differs from another through his personality.

The original Buddhism points out one's own responsibility to develop his own identity.

Personality could be adjusted as you desire by changing the nature of its flow by adding physical, verbal and mental wholesome behavior patterns to the flow of physical and mental composition. That is to say that life could be carried beyond the limits of cyclic influence.

It is this very fact that Buddhism teaches us and Buddhism is endowed with precious moulds in this respect. Lord Buddha can only pin point such moulds and the ultimate responsibility of leading one's life within those moulds and developing a personality of enlightened life style is all important.



Keywords - Personality, Early Buddhism, Mind and Body, Structure, Intellectual Process,